# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112784846
isurupaya@moe.gov.lk | www.moe.gov.lk


My Ref: ED/05/67/18/05/නව උසස් වීමේ පටිපාටිය

ඔබේ යොමුව / உமது இல. / Your Ref.:

දිනය / திகதி / Date: 2024.02.09

සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු වෙත

<u>අධ්‍යාපන අමාත්‍යාංශයේ ආශ්‍රිත නිලධාරී සේවා ගණය සඳහා වන උසස් කිරීමේ පටිපාටිය සඳහා අන්තර්ග්‍රහණය කිරීම</u>

උක්ත කරුණට අදාළව අධ්‍යාපන අමාත්‍යාංශයේ සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය වීමට මනාපය ප්‍රකාශ නොකරන ලද නිලධාරීන් සඳහා වන උසස් කිරීමේ පටිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2023.01.12 දින අනුමත කර ඇති අතර මෙය අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ කර ඇත.

02. ඒ අනුව අධ්‍යාපන අමාත්‍යාංශයේ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ (සංවර්ධන සහකාර, සැළසුම් හා මූල්‍ය සහකාර සහ කළමනාකරණ සහකාර - උපාධි) තනතුරු සඳහා වන උසස් කිරීමේ පටිපාටිය සඳහා අදාළ නිලධාරීන් අන්තර්ග්‍රහණය කිරීම පළමුව සිදු කළ යුතු වේ. ඒ අනුව එම අන්තර්ග්‍රහණ කටයුතු සඳහා මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍රය, පහත සඳහන් ලියවිලි ද සමඟ 2023.02.29 දිනට ප්‍රථම "ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්(ඒකාබද්ධ සේවා නොවන), අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල" යන ලිපිනයට නොපමාව යොමු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

I. උප්පැන්න සහතිකය
II. පත්වීම් ලිපිය
III. ස්ථිර කිරීමේ ලිපිය
IV. ජාතික හැඳුනුම්පත

(I - IV: සහතික කළ පිටපත්)

V. මුල් පත්වීමේ දින සිට වැටුප් වර්ධක ගෙවීම පිළිබඳ වාර්තාවක් පහත ආකෘතිය පරිදි

| වර්ෂය | වැටුප් වර්ධක දිනය | වැටුප් වර්ධක ගෙවීම පිළිබඳ විස්තර |
|---|---|---|
| | | |
| | | |

ආර් බී. ගන්කේවල
අතිරේක ලේකම් (අනධ්‍යයන හා ඒකාබද්ධ සේවා)
ලේකම් වෙනුවට

විද්‍යුත් තැපැල: noncombine@gmail.com
ෆැක්ස් අංකය : 011 2784864